සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

# නාට්‍ය හා රංග කලාව

8 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- II කොටස පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු ලියන්න.
- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට අදාළ වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 කතා වස්තුවක අවස්ථා හා සිද්ධි තුළ ඇති ක්‍රියා ප්‍රේක්ෂකයන් හමුවට ගෙන යන්නේ,
(1) සංවාද මඟිනි (2) රූපණය මඟිනි
(3) චරිත මඟිනි (4) චරිත නිරූපණය මඟිනි

02 අභිරූපන රංගනයක දී භාවිතා නොවන අභිනය වනුයේ,
(1) අංගික අභිනය (2) වාචික අභිනය
(3) සාත්වික අභිනය (4) ආහාර්ය අභිනය

03 පෙනෙන හෝ දකින අසන දෙයට වඩා ඇතුළතින්ම යමක් සිතීම හඳුන්වන්නේ,
(1) කල්පිතය යනුවෙනි. (2) නිර්මාණය යනුවෙනි.
(3) සංකල්පය යනුවෙනි. (4) පරිකල්පනය යනුවෙනි.

04 සමස්ත ශරීරාංග චලනය මඟින් අදහස් ප්‍රකාශ කිරීම.
(1) වාචික අභිනය වේ. (2) ආහාර්ය අභිනය වේ.
(3) ආංගික අභිනය වේ. (4) සාත්වික අභිනය වේ.

05 නාට්‍යයක චරිත නිරූපණයේ දී නළුවාගේ ගැළපීම ඉතා වැදගත් වේ. මෙලෙස නළුවන් තේරීම,
(1) අනුකරණය නම් වේ. (2) නළුවරණය නම් වේ.
(3) සමාරෝපය නම් වේ. (4) වෙස්වලා ගැනීම නම් වේ.

- පහත වගුව ඇසුරෙන් ප්‍රශ්න අංක 06 - 10 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| ගම දෝණිගේ වාරිත්තරේ | ඩී. කුමාරගේ | පුංචි අපට දුන් තේරේ | 18 සන්නිය |
| යකා දත් හිටෙව්වා වගේ | අමිතා රබ්බිටිගල | වලහා සහ මාෂා | රට යැකුම |
| පුහුල් හොරා කරින් දූනේ | සෝමලතා සුබසිංහ | අමර ගියා දිව්‍ය ලෝකේ | සූනියම් යාගය |

06 B අක්ෂරයේ සඳහන් නාමයන් ප්‍රසිද්ධ වූයේ,
(1) ළමා නාට්‍ය වලට (2) වීදි නාට්‍ය වලට
(3) කෙටි නාට්‍ය වලට (4) දිගු නාට්‍ය වලට

07 A අක්ෂරයෙන් සඳහන් කතා අයත් වන්නේ,
(1) ජාතක කතා වලට (2) උපමා කතාවලට
(3) ප්‍රස්තාව පිරුළු වලට (4) ජන කතා වලට

08 ළමා නාට්‍ය නිර්මාණය ඇතුළත් අක්ෂරය වන්නේ,

| | | | |
|---|---|---|---|
| (1) | A ය. | (2) | B ය. |
| (3) | C ය. | (4) | D ය. |

09 D අක්ෂරයෙන් සඳහන් නාමයන් අයත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| (1) | නාට්‍ය නිර්මාණ වලට | (2) | ශාන්තිකර්ම වලට |
| (3) | ගැමි නාටක වලට | (4) | පූජා කර්ම වලට |

10 D අක්ෂරයේ නාමයන් අයත් සම්ප්‍රදාය වනුයේ,

| | | | |
|---|---|---|---|
| (1) | පහත රට | (2) | රයිගම |
| (3) | සබරගමු | (4) | උඩරට |

- **පහත කියමන් ඇසුරෙන් ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) ''සමාරිතානු වර්ගයට අයත් මිනිහෙක් ඔහුගේ තුවාලවලට තෙල් හා මිදි යුෂ ගල්වා ප්‍රතිකාර කොට තානායමට ගෙන ගියේය.''

(ii) ''පූජක නම් එක්තරා බමුණෙක් රූමත් කාන්තාවක් සරණකර ගත්තේය.''

(iii) ''අපි ඔයාට උදව් කරන්නම් ඔයා සතුනට හිංසා නොකරන හොඳ ළමයෙක් වෙන්න.''

(iv) ''දුර්ගා බිය ගුල්ලෙකු සෙම්පතියෙකු බවටත් සරස්වති ගොළුවෙකු කවියෙකු බවටත් පත් කරයි.

11 කතෝලික උපමා කතාවක් ඇතුළත් ගද්‍ය කොටස වන්නේ,

(1) ii (2) iii (3) i (4) iv

12 ii වන ගද්‍ය කොටසින් කියැවෙන ආගමික කතාව වන්නේ,

(1) කතෝලික (2) බෞද්ධ (3) ඉස්ලාම් (4) හින්දු

13 ළමා නාට්‍ය නිර්මාණයක සංවාද කොටසකි.

(1) iii ය. (2) iv ය. (3) i ය. (4) ii ය.

14 එම සංවාද කොටස අයත් නාට්‍ය නිර්මාණය

| | | | |
|---|---|---|---|
| (1) | තොප්පි වෙළෙන්දා | (2) | වලහා සහ මාෂා |
| (3) | පුංචි අපට දූන් තේරෙයි | (4) | කදා වළලු |

15 හින්දු ආගමික කතාපුවතක ගද්‍ය කොටසකි.

(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන කෙටි පිළිතුරු ලියන්න.**

16 නරිබෑණා නාට්‍යයේ නිෂ්පාදකයා කවුරුන් ද?

:.............................................................................................................

17 සෝමලතා සුබසිංහ මහත්මියගේ නාට්‍ය 02 ලියන්න.

(i)............................................................ (ii)............................................................

18 ''සෝබාවදේ මෙපුර ''...... ගීතය ඇතුළත් නාට්‍ය නම් කරන්න.

:.............................................................................................................

19 සිරිත්මල්දම පද්‍ය පංතියේ රචකයා කවුරුන් ද?

:.............................................................................................................

20 ජාතක කතා ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍ය නිර්මාණ 02 ලියන්න.

1............................................................ 2............................................................

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න (03) කට පිළිතුරු ලියන්න.**
- **පහත සංවාදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| මාෂා | : | මොනවාද ඒ සැරේ වෙන්නේ යන්නේ .................... කවුද ඒ පාර .............. කවුද ඔයාලා |
| මී මැස්සෝ | : | අපි මේ මී මැස්සෝස...... මේ ගෙදර ඉන්න වලහා අපේ මී මැසි ජනපද විනාශ කරල මී වද ටික ගත්තා අපි ආවේ වලහා ට පාඩමක් උගන්වන්න. |
| මාෂා | : | වලහා තාම ආවේ නෑ.... වලහා ගෙදර නෑ ..... |
| මී මැස්සෝ | : | මේ වලහාගේ ළමයෙන් වෙන්න ඇති. |
| | | අපි මෙයාට පාඩමක් උගන්වමු. |
| මාෂා | : | මම වලහා ගේ ළමයෙන් නොවේ. |
| | : | වලහා මාව මෙහෙ හිරකරගෙන ඉන්නේ ගෙදර යන්න විදියක් නෑ. |

01 (i) මෙම සංවාදය ඇතුළත් නාට්‍ය නම් කරන්න. (ලකුණු 02)

(ii) නාට්‍යයේ නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙම සංවාදයේ චරිත කීයක් සිටී ද ඔවුන් නම් කරන්න. (ලකුණු 02)

(iv) මී මැස්සන් වලහාගේ නිවසට පැමිණියේ ඇයි ? (ලකුණ 02)

(v) නාට්‍යයෙන් ලබා දෙන පණිවිඩ 04 ක් ලියන්න. (ලකුණු 02)

02 (i) රංග අභ්‍යාස 02 ක් හා රංග ක්‍රීඩා 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) රංග ක්‍රීඩා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබ කැමති රංග ක්‍රීඩාවක් නම් කර සිදු කරන ආකාරය ලියන්න. (ලකුණු 05)

03 (i) වේෂ භූෂණ නමින් හඳුවන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) රජ චරිතයකට සුදුසු රංග වස්ත්‍ර වල රූප සටහන් අඳින්න. (ලකුණු 05)

04 (i) නාට්‍ය කලාවේ දී කටහඬ සංවර්ධනයට හඬ අභ්‍යාසයක් ලෙස ගායනය කළ හැකි ජන ගී වර්ග 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ශාන්ති කර්ම ගී අයත්වන නර්තන සම්ප්‍රදාය 03 නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ ඉගෙන ගත් ශාන්ති කර්ම ගීයක් ලියන්න. (ලකුණු 05)

05 (i) අභිනය සංකල්පය සඳහන් ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න. (ලකුණු 02)

(ii) අභිනය කීය ද? ඒවා නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ නම් කළ අභිනයන් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**අනාවරණ පරීක්ෂණය 2021**

**8 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව** **ප්‍රායෝගික පරීක්ෂණය**

උපදෙස්

**සියලුම ප්‍රායෝගික කොටස් ඉදිරිපත් කළ යුතුය. 1, 2, 3, 4 ඒකල ඇගයීමකි. 5 කණ්ඩායම් ඇගයීමකි.**

01 නාට්‍ය ගීතයක් ගායනය හා රංගනයෙන් ඉදිරිපත් කිරීම (ලකුණු 10)

02 පහත ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිරූපණයක් කිරීම.
කොස්ස / පෑන / කෝදුව / පොත / වතුර බෝතලය /බෑගය (ලකුණු 10)

03 නිර්දේශිත පිටපතින් සංවාද කොටසක් ඉදිරිපත් කිරීම. (ලකුණු 10)

04 විවිධ අරුත් ඉස්මතු වන පරිදි උච්චාරණය (උච්චාරණ විලාස 03 ක් වත් විය යුතුය.)
බනින්නෙපා
මට කන්ඩ බෑ
ඒ මල හරි ලස්සනයි
ඔයාට දුකයි ද? (ගුරුවරයාගේ අභිමතය පරිදි වෙනස් කරගත හැක.) (ලකුණු 10)

05 සූදානම්ව පැමිණෙන කණ්ඩායම් නාට්‍ය ඉදිරිපත් කිරීම. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 02 | 2 | 03 | 4 | 04 | 3 | 05 | 2 | 06 | 1 | 07 | 4 | 08 | 3 |
| 09 | 2 | 10 | 1 | 11 | 3 | 12 | 2 | 13 | 1 | 14 | 2 | 15 | 4 | | |

16 දයානන්ද ගුණවර්ධන

17 තොප්පි වෙළෙන්දා, පුංචි අපට දුන් තේරෙයි, විකෘති යන නාට්‍ය වලට

18 තාරාවෝ ඉගිලෙති 19 ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්

20 කඳා වළලු, මනමේ, මහාසාර, පබාවතී යන නාට්‍ය වලට (20 × 2 = 20)

## II කොටස

01 (i) වලහා සහ මාෂා (ලකුණු 02)

(ii) ඩී. කුමාරගේ (ලකුණු 02)

(iii) 2 යි. මාෂා / මී මැස්සෝ (ලකුණු 02)

(iv) වලහා මී ගම්මාන කඩාගෙන ආ මී වද රැගෙන යාමට යන පිළිතුරට (ලකුණු 02)

(v) සතුන්ට හිංසා නොකළ යුතු බව / වැඩිහිටියන්ට කීකරු විය යුතුය / ස්ථානෝචිත ප්‍රඥාව භාවිතය / අවිහිංසා වාදී බව වැනි කරුණු වලට (ලකුණු 02)

02 (i) හඬ අභ්‍යාසය, ශිථිලකරණ, ස්වසන, සංවේදන යන අභ්‍යාසය, ලේන්සු හැංගීම, ගස් මාරුව, මකරාගේ දූපත, මී මෝ මීයෝ වැනි රංග ක්‍රීඩා වලට (ලකුණු 02)

(ii) සබකෝලය දුරු වීම / කණ්ඩායම් හැඟීම් වර්ධනය / නම්‍යශීලි බව / ක්ෂණික ප්‍රතිචාර දැක්වීම / ඉවසීම වර්ධනය / පෞරුෂ සංවර්ධනය වැනි කරුණු 03 කට (ලකුණු 03)

(iii) සුදුසු රංග ක්‍රීඩාවක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03 (i) ආහාර්ය අභිනයට අයත් නළුවාගේ බාහිර සමාරෝපණයට උදව් වන ඇඳුම් පැළඳුම් ආභරණ යන අදහස ලියා ඇත්නම්. (ලකුණු 02)

(ii) භාවිතයේ පහසුව / චරිතයට උචිත වීම / වර්ණ භාවිතය / කතාවට ගැළපීම /නාට්‍ය ශෛලියට උචිත වීම / ප්‍රවාහන පහසුව වැනි කරුණු 03 ක් ලියා ඇත්නම් (ලකුණු 03)

(iii) රජ චරිතයට සුදුසු රංග වස්ත්‍රාභරණ ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04 (i) දූල් ගී / ශාන්තිකර්ම ගී / වැදි ගී වැනි / ගැල් ගී වැනි 03 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 02)

(ii) උඩරට / පහතරට / සබරගමු ලියා ඇත්නම් (ලකුණු 03)

(iii) සුදුසු ශාන්ති කර්ම ගීයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05 (i) නාට්‍ය ශාස්ත්‍රය / භරත මුනිවරයා

(ii) 4 යි. ආංගික අභිනය / සාත්වික අභිනය / වාචික අභිනය / ආහාර්ය අභිනය (ලකුණු 03)

(iii) ආංගික අභිනය

අඟ පසඟ චලනය කිරීමෙන් යාම් ඒම් මගින් හා ඉරියව් පෑමෙන් අදහස් ප්‍රකාශනය.

වාචික අභිනය

වචන, දෙබස් හා ගීත මගින් කරුණු ලබන ප්‍රකාශනයන්

සාත්වික අභිනය

චරිතයට උචිත පරිදි භාවයන් හා හැඟීම් මුහුණින් ප්‍රකාශනය කිරීම.

ආහාර්ය අභිනය

නළුවාගේ බාහිර සමාරෝපණයට උදව් වන්නා වූ නළුවන් බැහැරින් එකතුකර ගන්නා වූ ඇඳුම්, පැළඳුම්, ආභරණ යන අදහස් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)